සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security - Social Security Division

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / Your No: ..............................

දිනය / திகதி / Date: 2020.06. 23

සමෘද්ධි ප්‍රජාමුල බැංකු චක්‍රලේඛ අංක :-2020/07ට දෙවන එකතුව

සියළුම සමෘද්ධි ප්‍රජාමුල බැංකු/ බැංකු සමිති කළමනාකරුවන් සහ

සමෘද්ධි බැංකු සමිති විධායක කමිටු/ සමෘද්ධි බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන් වෙත,

**<u>Covid-19 වෛරස වසංගත තත්ත්වය මත බලපෑමට ලක් වූ සමෘද්ධි බැංකු / බැංකු සමිති සාමාජිකයින්ට ණය මුදල් ගෙවීමට සහන සැලසීම</u>**

Covid-19 වෛරස වසංගත තත්ත්වය මත ඇති වූ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සමෘද්ධි බැංකු / බැංකු සමිති හරහා ලබා ගත් ණය මුදල් ආපසු ගෙවීමට සහන සැලසීම උදෙසා සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2020/07 හා ඊට නිකුත් කළ පළමු එකතුව මඟින් උපදෙස් ලබා දී ඇත.

චක්‍රලේඛ අංක 2020/07 හි ඡේද අංක 06 සහ 2020/07 ට පළමු එකතුවේ ඡේද අංක 2.5 සංශෝධනය සිදු කිරීමටත් ඊට අමතරව පහත උපදෙස් අනුව කටයුතු කිරීමට 2020.06.22 දින පැවැත්වූ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සහ ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරණ මණ්ඩල රැස්වීම් අංක 68 මඟින් තීරණය කර ඇත. ඒ අනුව මෙම නව එකතුව නිකුත් කරන අතර එම උපදෙස් අනුව සහන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන ලෙස දන්වමි.

**02.** චක්‍රලේඛ අංක 2020/07 හි ඡේද අංක 6 සහ 2020/07 ට පළමු එකතුවේ ඡේද අංක 2.5 සංශෝධනය කරන අතර, දැනට මාසිකව ණය මුදල් ගෙවන ලද ණයකරුවන් සහන කාලය ආරම්භ වන 2020.03.15 දින සිට සහන ඉල්ලීම සිදු කරන දිනය දක්වා ගෙවූ මාසික ණය වාරික සඳහා ගිවිසුම්ගත පොලිය ගෙවිය යුතුය. දැනට 4% ක සහන පොලියක් අය කරගෙන ඇත්නම්, ගිවිසුම්ගත පොලි අනුපාතයට අනුව පොලිය සකස් කර හිඟ පොලී මුදල ණයකරු දැනුවත් කර අයකර ගත යුතුය. තවද ඉතිරි කාලය සඳහා (2020.09.14 දක්වා) 4% ක සහන පොලි අනුපාත යටතේ ණය ගෙවීමේ කාලය දීර්ඝ කර ලබාදිය හැක.

**03.** සහන වැඩ පිළිවෙල යටතේ ණය ගෙවීම් සඳහා ඉදිරි මාස 06 ක කාලය හෝ ඊට අඩු ඉදිරි කාලයක් ලබාගන්නා ණයකරුවන් 2020.03.15 සිට 2020.09.14 දක්වා කාලය ඇතුලත මාසිකව ණය වාරික ගෙවන හෝ එකවර ණය මුදල පියවන විටක, ගිවිසුම්ගත පොලිය අනුව පොලි අය කළ යුතුය. (සහන පොලිය හිමි නොවේ) මෙම මාස 6 ක සහන කාලය තුල එකතු වන 4% බැගින් වන පොලි මුදල කොටස් වශයෙන් ගෙවීමට උපරිම මාස 24 ක කාලයක් ලබාදීමට ද හැක. (ගිවිසුම්ගත කාලයට යටත්ව)

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | wajira | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

**04.** කල්පසු වූ / බොල් ණයකරුවන්ට ද සහන කාලය ආරම්භ වන 2020.03.15 දින දක්වා ඇති හිඟ වාරික සහ ගිවිසුම්ගත පොලිය සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන විටක මෙම සහන පාලක මණ්ඩල / විධායක කමිටු අනුමැතිය මත ලබාදිය හැකිය.

**05.** යම් ණයකරුවෙකු ණය මුදල් ගෙවීමට ලබාගන්නා සහන කාලය අවසන් වී, එකවර සම්පූර්ණ පිටහිටි ණය මුදල පියවන විටක ගිවිසුම්ගත පොලි අනුපාතය අනුව පොලිය ගණනය කළ යුතුය.

**06.** ණයකරුවෙක් තම සහන ඉල්ලීම සමෘද්ධි බැංකුවට ලද දිනය වලංගු දිනය ලෙස සලකා කටයුතු කළ යුතුය.

07. **වාර්ෂිකව 4% පොලී අනුපාතයක් යටතේ ණය වාරික ගෙවීමට ඉදිරි මාස 6 ක් ද ,එමෙන්ම එකතුවන සහන පොලී මුදල කොටස් වශයෙන් ගෙවීමට උපරිම මාස 24 ක කාලයක් සහිතව වැඩ පිළිවෙලක් දියත් කරනු ලබන්නේ සමෘද්ධි බැංකු/ බැංකු සමිති තැන්පතු සඳහා ගෙවනු ලබන වාර්ෂික 5% - 7% ක් පොලී අනුපාතයන් නොවෙනස්ව ලබාදෙමින්, දැනට ක්‍රියාත්මක ණය සඳහා 10% - 12% ක් අතර පොලී අනුපාතයක් අයවීමට තිබිය දී පොලී අනුපාතය 4% ක් දක්වා අඩු කර, ණය පොලී ආදායමක් ද අහිමි කර කටයුතු කිරීම සිදු කරනු ලබන්නේ සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය විසින් කොවිඩ් - 19 වෛරස් තත්ත්වය තුලින් බලපෑමට ලක්වූ අඩු ආදායම්ලාභීන් නඟා සිටුවීමේ අරමුණුන් දැඩි සාකච්ඡාවක් සිදු කර මෙම සංශෝධනය ඇති කළ බව ද අවධාරණයෙන් දැනුම්දෙමි.**

08. **කොවිඩ් - 19 වෛරස් වසංගත තත්ත්වය මත බලපෑමට ලක්වූ ක්ෂුද්‍ර සහ කුඩා ව්‍යාපාර බලගැන්වීම උදෙසා වාර්ෂික පොලී අනුපාතය 4% ක සහන පොලියක් යටතේ විශේෂ ණය යෝජනා ක්‍රමයක් බැංකු සාමාජිකයන් වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතිය සමෘද්ධි ප්‍රජා මූල බැංකු සහ බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය අනුමත කර ඇති අතර, ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් ඉදිරියේදී දැනුම්දීමට කටයුතු කරමි.**

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

01. ලේකම් , කාන්තා,ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ස
02. ලේකම් , සමාජ ආරක්ෂණ අංශය - කා.දැ.ස
03. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් /දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරුන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස හා අ.ක.ස.
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
05. අධ්‍යක්ෂ- ක්ෂුද්‍රමූල්‍ය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
06. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස හා අ.ක.ස.
07. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් ,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.ස. හා අ.ක.ස.
08. සියළුම අංශ ප්‍රධානීන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
09. සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අ.ක.ස.